

# වාර්ෂික වාර්තාව

# வருடாந்த அறிக்கை

# 2015

## සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## கட்புல மற்றும் அரங்காடற் கலைகள் பல்கலைக்கழகம்

## දැක්ම

දෘශ්‍ය හා ප්‍රාසංගික කලා මගින් තුළින් මානව වර්ගයාගේ සම්ප්‍රසාදය උදෙසා විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානය වීම.

## මෙහෙවර

විශ්වවිද්‍යාලයේ සියලු විද්‍යාර්ථීන් සහ සාමාජිකයින් උදෙසා සංස්කෘතිකමය වශයෙන් පරිපූර්ණ අවස්ථා ලබාදීම. නිර්මාණශීලීභාවය උත්තේජනය කරන පරිසරයක් තුළ තාක්ෂණික දියුණුවට අනුකූලවන කලා සහ නිර්මාණ මගින් ආසියානු කලාපයෙහි ප්‍රමුඛතාව ලබා ගැනීම.

# පටුන


| | | |
|---|---|---|
| 1.1 | උපකුලපතිවරයාගේ සමාලෝචනය-2015 | 1-6 |
| 1.2 | ආයතනික සංවිධාන සැලැස්ම | 7 |
| 1.3 | පාලක සභාව | 8-9 |
| 2 | සම්මාන, ඇගයීම් සහ ප්‍රදානයන් | 9 |
| 3 | සම්පත් සහ සිසුන් පිළිබඳ විස්තරය | 9-12 |
| 4 | කාර්ය මණ්ඩල විස්තර | 13 |
| 4.1 | අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර | 13 |
| 4.2 | පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර | 13-14 |
| 4.3 | සමස්ත කාර්ය මණ්ඩල වෙනස්වීම් | 14 |
| 5 | පශ්චාද් උපාධි පිළිබඳ විස්තර | 15 |
| 6 | බාහිර උපාධි පාඨමාලා පිළිබඳ විස්තර | 15 |
| 7 | පර්යේෂණ පිළිබඳ විස්තර | 15-16 |
| 8 | කාර්ය මණ්ඩල සංවර්ධනය පිළිබඳ විස්තර | 16 |
| 8.1 | පරිපාලන කාර්යය මණ්ඩල සහභාගි වූ සම්මන්ත්‍රණ වැඩසටහන් සහ වැඩමුළු විස්තර | 16-17 |
| 8.2 | අනධ්‍යයන කාර්යය මණ්ඩල සහභාගී වූ සම්මන්ත්‍රණ වැඩසටහන් සහ වැඩමුළු විස්තර | 17 |
| 9 | යටිතල පහසුකම් පිළිබඳ විස්තර | 18 |
| 10 | පුස්තකාලය පිළිබඳ තොරතුරු | 18 |
| 11 | මහපොළ සහ ශිෂ්‍යාධාර පිළිබඳ විස්තරය | 18 |
| 12 | විගණන කමිටු වාර්තාව | 19-20 |
| 13 | 2015 අවසාන ගිණුම් වාර්තාව | |
| 14 | 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව | |
| 15 | 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාවේ පිළිතුරු ලිපිය | |

## 1.1 උපකුලපතිවරයාගේ සමාලෝචනය - 2015

කැලණිය විශ්වවිද්‍යාලයේ අනුබද්ධිත ආයතනයක් වශයෙන් පැවැති සෞන්දර්ය අධ්‍යයන ආයතනය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) ඡේදය සමඟ කියවිය යුතු 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වන වගන්තිය ප්‍රකාරව අංක 1400/24 දරණ රජයේ අති විශේෂ ගැසට් නිවේදනය මගින් 2005 වසරේ ජූලි මස 01 දින සිට සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය වශයෙන් ස්ථාපනය කරන ලදී. 2005 වසරේ සිට 2014 වසර දක්වා උපකුලපතිවරුන් දෙදෙනෙකු යටතේ පාලනය වූ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය වර්ෂ 2014 ඔක්තෝම්බර් මස 30 වන දින මා පත්වනුයේ එහි තුන්වන (03) උපකුලපතිවරයා ලෙසය. 2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනික, සංවර්ධනීය හා පරිපාලනීය කටයුතුවල සංක්ෂිප්තය උපකුලපතිවරයා ලෙස සටහනක් තබනු ලබන්නේ ඉමහත් සතුටිනි.

අප විශ්වවිද්‍යාලය දෘශ්‍ය කලා, සංගීත සහ නර්තන හා නාට්‍ය කලා වශයෙන් පීඨත්‍රයකින් හා අධ්‍යයනාංශ 22කින් සමන්විතය. මෙම විශ්වවිද්‍යාලයේ 2015 වසර සඳහා ප්‍රථම වසරට බඳවා ගැනීමේ දී දෘශ්‍ය කලා පීඨයට සිසුන් 101ක් ද, නර්තන හා නාට්‍ය කලා පීඨයට සිසුන් 253 ක් ද, සංගීත පීඨයට සිසුන් 223ක් ද ඇතුළත් කොට ගැනිණ. මෙම නව විද්‍යාර්ථීන් හැරුණු කොට මේ වනවිට පීඨත්‍රයෙහි වසර හතරෙහි ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව, දෘශ්‍ය කලා පීඨයේ සිසුන් 427ක් ද, නර්තන හා නාට්‍ය කලා පීඨයේ 1015ක් සහ සංගීත පීඨයේ සිසුන් 739කි. ඒ අනුව සම්පූර්ණ විද්‍යාර්ථීන් එකතුව 2181කි.

2015 වර්ෂය තුළ දී පීඨත්‍රයට අයත් විද්‍යාර්ථීන් උදෙසා අර්ධ සහ පූර්ණ ශිෂ්‍යාධාර වශයෙන් 1275 දෙනෙකුට ශිෂ්‍යාධාර පිරිනමා ඇති අතර මහපොළ ශිෂ්‍යාධාර ද සිසුන් 690 දෙනෙකුට පිරිනමා ඇත. ඒ අනුව ශිෂ්‍යාධාර හා මහපොළ සිසුන් 1965 දෙනෙකුට ලබා දී ඇති අතර එය මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 90.76% ක් වෙයි.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන ඒකකය 2008 වසරේ දී ආරම්භ කරන ලද අතර ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා එහි අධ්‍යක්ෂ ලෙස පත් වූ අතර ලබා ඇති ප්‍රගතිය පිළිබඳ අගයමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2015 වසරේ එම ඒකකය පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයක් ලෙස ස්ථාපිත කරන ලදී. 2015 වසර වන විට පශ්චාද් උපාධිය සඳහා ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 15කි. ඉන් ශාස්ත්‍රපති උපාධිය අවසන් ශිෂ්‍ය ප්‍රමාණය 03කි. ප්‍රාසංගික කලාපති උපාධිය අවසන් ශිෂ්‍ය සංඛ්‍යාව 10කි. දර්ශනපති සහ දර්ශනසූරී උපාධි එක් අයෙකු බැගින් අවසන් කොට ඇත.

2015 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ලෙස රුපියල් මිලියන 673 ක් ද මූලධන වියදම් ලෙස රුපියල් මිලියන 260 ක් ද මහාභාණ්ඩාගාරයෙන් ලැබී ඇත.

<u>සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට අවැසි භෞතික සම්පත් සංවර්ධනය පිළිබඳ කෙටි සටහන</u>

| **යටිතල පහසුකම් පිළිබඳ විස්තර** | **මුළු පිරිවැය ඇස්තමේන්තුව (TEC) (රුපියල් මිලියන)** | **2015 වර්ෂය වන විට වියදම (රුපියල් මිලියන)** | **භෞතික ප්‍රගතිය** |
|---|---|---|---|
| ඇල්බට් චන්ද්‍රවංක සංවර්ධන ව්‍යාපෘතිය (අදියර III- පියවර II) සංගීත පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම | 68.0 | 19.9 | 75% |
| ඇල්බට් චන්ද්‍රවංක සංවර්ධන ව්‍යාපෘතිය (අදියර IV) සංගීත පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම | 144.5 | 104.5 | 100% |
| Stage Lighting and Communication Wiring (සංගීත පීඨ ශ්‍රවණාගාරය සඳහා) | 10.3 | 6.8 | 100% |

<u>කාර්ය මණ්ඩල සංවර්ධනය</u>

01. 2013 හා 2014 වර්ෂවල කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පැවැත්වූ උසස් අධ්‍යාපනය සඳහා වූ ඉගැන්වීම් පිළිබඳ පාඨමාලාව සම්පූර්ණ කරන ලද ආචාර්ය මණ්ඩලයට සහතික පත්‍ර ලබාදීම. - 2015.10.01
02. අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා Microsoft ආයතනය සමඟ එක්ව "Learning Material Development" වැඩමුළුව පැවැත්වීම. - 2015.11.12
03. 2015 වර්ෂය සඳහා උසස් අධ්‍යාපනය සඳහා වූ ඉගැන්වීම් පිළිබඳ පාඨමාලාව ආරම්භ කිරීම. - 2015.11.15
04. පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා "Research Methodology" වැඩමුළුව පැවැත්වීම. 2015.11.21 හා 2015.12.29
05.අධ්‍යයන කාර්මණ්ඩලය සඳහා කිතුල්ගල "ඇඩ්වෙන්චර් කැම්ප්" ආයතනයෙහි දෙදින නේවාසික වැඩමුළුවක් පැවැත්වීම. - 2015.12.20, 2015.12.21

**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට පත්වී දස වසරක් පිරීම නිමිත්තෙන් පහත සඳහන් පරිදි වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.**

01. **දෘශ්‍ය කලා පීඨය** - සම්භාව්‍ය චිත්‍ර මූර්ති ඇතුලත් දෘශ්‍ය කලා ප්‍රදර්ශනය සහ සජීවී දර්ශන ඇතුලත් චිත්‍රාගාර තුළ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීම.

02. **සංගීත පීඨය** - කෙටි චිත්‍රපට ප්‍රදර්ශනය, ශාස්ත්‍රීය සංගීතමය වැඩසටහන්, ආචාර්ය වික්ටර් රත්නායක, ලක්ෂ්මන් විජේසේකර සහ විශාරද එඩ්වඩ් ජයකොඩි ඇතුලු ජ්‍යෙෂ්ඨ ආදී විද්‍යාර්ථීන්ගේ සංගීතමය හා සාකච්ඡාමය වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

03. **නර්තන හා නාට්‍ය කලා පීඨය** - කථිකාචාර්ය සදානන්දන් විශ්වානාදන් ඇතුලු පිරිස විසින් ඉදිරිපත් කරනු ලබන දමිළ ජන ගී වැඩසටහන, උඩරට, පහතරට, සබරගමු නර්තන ප්‍රසංග, වාද්‍ය සංගීත ඉන්දියානු හා ආසියානු අධ්‍යයනාංශ මගින් ඉදිරිපත් කරන ලද නිර්මාණාත්මක ප්‍රසංග, තෙරුක්කූත්තු නර්තන හා නාට්‍ය ප්‍රසංගය, මහාචාර්ය කඩ්රි ඉස්මයිල් (Prof. Qadri Ismail) මහතා විසින් පවත්වන ලද දේශනය, යොවුන් සම්මාන නාට්‍ය උළෙල නියෝජනය කරමින් "චක්‍රපාණි" නාට්‍යය ඉදිරිපත් කිරීම (2015), උපාධි අවසන් වසර නාට්‍ය නිෂ්පාදනයක් වන "ප්‍රොමිතියස් පෙම්වතිය" නාට්‍යය (2015) ඉදිරිපත් කිරීම, ග්‍රන්ථ එළි දැක්වීම සහ පීඨය මගින් සජීවීව ඉදිරිපත් කරනු ලබන කොහොඹා කංකාරි ශාන්තිකර්මය ඉදිරිපත් කිරීම.

04. දසවන සංවත්සර උළෙල නිමිත්තෙන් විශ්‍රාම ලත් සියලුම ආචාර්යවරු වෙනුවෙන් "**සෞන්දර්යාභිමානී**" ගුරු උපහාර උළෙලක් පැවැත්වීමට කටයුතු කරන ලදී.

<u>**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද කලා කටයුතු සහ වෙනත් නිර්මාණීය ක්‍රියාකාරකම්**</u>

2015 ජනවාරි මස 12 සහ 13 යන දෙදින තුළ නර්තන හා නාට්‍ය කලා පීඨය මගින් නේවාසික නර්තන වැඩමුළුවක් හා සම්මන්ත්‍රණයක් එංගලන්තයේ ලිවර්පූර් හෝප් (Liverpoor Hope University) විශ්වවිද්‍යාලයේ ආචාර්ය රචෙල් ස්වීනීස් (Dr. Rachel Sweenys) විසින් විශ්වවිද්‍යාලයීය නාට්‍ය මුද්‍රා නාට්‍ය නව නර්තන අධ්‍යයනාංශ විද්‍යාර්ථීන් සඳහා පවත්වනු ලැබීය.

"TxTස්වර්ණාභරණ සහ විලාසිතා ප්‍රදර්ශනය" දෘශ්‍ය කලා පීඨයේ රෙදිපිළි හා ඇඟළුම් අධ්‍යයනාංශය මගින් 2016 ජනවාරි මස සංවිධානය කරන ලදී.

විශ්වවිද්‍යාලයීය කාන්තා විද්‍යාර්ථීන් 09 දෙනෙකුගෙන් සමන්විත "**තූර්යා වාද්‍ය වෘන්දය** "මගින් 2015-01-10 වන දින විශිෂ්ට වාදන ප්‍රසංගයක් නර්තන හා නාට්‍ය කලා පීඨයේ ප්‍රධාන රංග ශාලාවේදී සාර්ථකව ඉදිරිපත් කෙරිණි.

HETC ව්‍යාපෘතිය හා ඉංග්‍රීසි අධ්‍යයන ඒකකය එක්ව 2015 ජනවාරි මස 23 වන දින ඉංග්‍රීසි නාට්‍ය තරඟයක් පවත්වන ලදී.

නර්තන හා නාට්‍ය කලා පීඨයේ , ඉන්දියානු හා ආසියානු නර්තන අධ්‍යයනාංශයේ සිසුන් විසින් සංවිධානය කරන ලද "**නූර්තියම්බරී" (Nurthyambari)** නර්තන වැඩසටහන 2015 ජනවාරි මස 29 වන දින විශ්වවිද්‍යාලයේ දී පවත්වන්නට යෙදුණි.

ඩෙන්මාර්කය, ස්කොට්ලන්ඩ්, ඕස්ට්‍රේලියාව, ජර්මනිය සහ ආජන්ටිනාව නියෝජනය කරමින් කලා කරුවන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් 2015-02-08 වන දින නර්තන හා නාට්‍ය කලා පීඨය නැරඹීමට

පැමිණි අතර ඔවුන්ගේ පැමිණීම නිමිති කරගෙන ආරාධිතයින් සහ විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් විසින් ප්‍රසංගයක් ඉදිරිපත් කරන ලදී.

2015-02-18,19 යන දෙදින තුළ නර්තන හා නාට්‍ය කලා පීඨයේ නර්තන රංග කලා ඉතිහාසය සහ සිද්ධාන්ත අධ්‍යයනාංශයේ සිනමා කවය මගින් සංවිධානය කරන ලද චිත්‍රපටයක් සහ ඒ පිළිබඳ විචාරාත්මක වැඩසටහනක් පවත්වන ලදී.

දිවංගත ආචාර්ය පණීභාරත මහතාගේ ගුණානුස්මරණය නිමිති කරගෙන 2015-02-24 දින සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් විශ්වවිද්‍යාලයේ රංග ශාලාවේදී ජාතික නර්තන දිනය පවත්වන්නට යෙදුණි.

වාර්ෂිකව ඉන්දියානු හා ආසියානු නර්තන අධ්‍යයනාංශය මගින් සංවිධානය කරනු ලබන මිණි බැඳීමේ මංගල්‍යය පළමු වසර සිසුන් සඳහා 2015-03-04 වන දින ප්‍රථම වතාවට විශ්වවිද්‍යාලයේ දී පැවැත්විණ. කථක් නර්තනය අධ්‍යයනය කරන සිසුන්ගේ විශිෂ්ට පියවරක් ලෙසින් මෙය සැලකේ.

දෘශ්‍ය කලා පීඨයේ ඉතිහාසය හා කලා සිද්ධාන්ත අධ්‍යයනාංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චන්ද්‍රගුප්ත තේනුවර මහතා විසින් සංවිධානය කරන ලද ප්‍රදර්ශනයක් 2015-04-28 සිට 30 දින දක්වා මහජන ප්‍රදර්ශනය සඳහා දෘශ්‍ය කලා පීඨයෙහි ජේ.ඩී.ඒ. පෙරේරා කලාගාරයේ දී පවත්වන්නට යෙදුණි.

ජාතික මෙන්ම සංස්කෘතික සංහිඳියාව වර්ධනය කිරීමේ අරමුණින් විශ්වවිද්‍යාල පද්ධතියේ පළමු වතාවට ජාතික මට්ටමින් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය මගින් සංවිධානය කොට සිංහල සහ දමිළ භජන් ගීත වැඩසටහනක් කතරගම මහා දේවාලයේ දී 2015 ජූලි 15 වන දින විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් සිසුන් සමඟ එක්ව කඳ සුරිඳු වන්දනා රඟ පෙළහර පවත්වන්නට යෙදුණි.

2015-07-02 සිට 2015-07-15 දින දක්වා කොරියාවේ පැවැති ලෝක විශ්වවිද්‍යාල මලල ක්‍රීඩා සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල නියෝජනය කරමින් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් කිහිපදෙනෙකු මීටර් 400 සහ මීටර් 400 කෙටි දුර ධාවන තරඟ සඳහා සහභාගී වූහ.

විශ්වවිද්‍යාලයේ දසවන සංවත්සරයෙහි එක් අංගයක් ලෙස දෙහිවල ඉදිකරන ලද නව පිරිමි නේවාසිකාගාරය "**කීර්ති හේරත්**" නේවාසිකාගාරය ලෙස නම් කරන ලදී.

සංගීත පීඨයේ පළමු වසර සිසුන් විසින් සංවිධානය කොට ඉදිරිපත් කරන ලද **"සරස්වතී පූජා"** වැඩසටහන 2015 ජූලි මස 30 වන දින විශ්වවිද්‍යාලයේ ලයනල් එදිරිසිංහ ශාලාවේ දී පවත්වන්නට යෙදුණි.

කොරියානු ජාතික විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙක් සහ සිසුන් 10දෙනෙකුගේ සහභාගීත්වයෙන් **"සිහින ව්‍යාපෘතිය"** නමින් කලාත්මක කුසලතා හුවමාරු කර ගැනීමේ අරමුණින් සංවිධානය කරන ලද වැඩසටහනක් 2015 අගෝස්තු මස 03 වන දින සිට 14 වන දින දක්වා දෘශ්‍ය කලා පීඨයේ දී පැවැත්විණ.

විශ්වවිද්‍යාලයේ විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය මගින් සංවිධානය කරන ලද ඩිප්ලෝමා සහතික පත්‍ර ප්‍රදානෝත්සවයක් ප්‍රථම වතාවට විශ්වවිද්‍යාලයේ දී 2015-08-30 වන දින පවත්වන ලදී.

නර්තන හා නාට්‍ය කලා පීඨයෙහි නාට්‍ය මුද්‍රා නාට්‍ය හා නූතන නර්තන අධ්‍යයනාංශය විසින් වාර්ෂිකව පවත්වනු ලබන නාට්‍ය සංදර්ශනයක් 2015-08-30 දින සිට 2015-09-15 වන දින දක්වා පණීභාරත රංග ශාලාවේ දී පවත්වන්නට යෙදුණි.

කියුබානු හිටපු ශ්‍රී ලංකා තානාපති ඇතුළු කණ්ඩායමක් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය නැරඹීම සඳහා 2015 සැප්තැම්බර් මස 04 දින පැමිණි අතර කියුබානු තානාපති කාර්යාලය සහ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය ඒකාබද්ධව 2016 වර්ෂයේ දී ප්‍රදර්ශනයක් සංවිධානය කොට දෘශ්‍ය කලා පීඨයේ දී පැවැත්වීමට මෙහිදී තීරණය විය.

චීනයේ ෂැන්ඩොංග් විශ්වවිද්‍යාලය සහ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමක් 2015-10-12 වන දින අත්සන් කරන ලදී. එම අවබෝධතා ගිවිසුමට අනුව ෂැන්ඩොංග් විශ්වවිද්‍යාලයේ සංස්කෘතික කණ්ඩායමක් විසින් සංස්කෘතික සංදර්ශනයක් 2015-10-19 වන දින පණීභාරත රංග ශාලාවේ දී පවත්වන ලදී. එමෙන්ම චීනයේ ෂැන්ඩොංග් විශ්වවිද්‍යාලයේ සංස්කෘතික කණ්ඩායමක් විසින් ඡායාරූප ප්‍රදර්ශනයක් 2015-10-20 වන දින දෘශ්‍ය කලා පීඨයේ, ජේ.ඩී.ඒ.පෙරේරා කලා ගාරයේ දී පවත්වන ලදී.

උසස් අධ්‍යාපන අමාත්‍යාංශ HETC ව්‍යාපෘතිය ආධාර මගින් පරිගණක 50 න් සමන්විත පරිගණක විද්‍යාගාරය නර්තන හා නාට්‍ය කලා පීඨයේ දී උත්සවාකාරයෙන් 2015 නොවැම්බර් මස 11 වන දින විවෘත කරන ලදී.

ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සහ ඉන්දියානු සංස්කෘතික ආයතනය සම්බන්ධීකරණයෙන් ඡායාරූප ප්‍රදර්ශනයක් 2015-11-11 වන දින ජේ.ඩී.ඒ.පෙරේරා කලා ගාරයේ දී පැවැත්විණි.

බරණාසි විශ්වවිද්‍යාලයේ මහාචාර්ය විදී නගර් මහතා විසින් නර්තන හා නාට්‍ය කලා පීඨයේ ඉන්දියානු සහ ආසියානු නර්තන අධ්‍යයනාංශයේ සිසුන් සඳහා කථක් සහ භරත නාට්‍යය වැඩමුළුවක් 2015-11-11 වන දින පණීභාරත රංග ශාලාවේ දී පවත්වන ලදී.


2015-11-18 වන දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී ආචාර්ය පණ්ඩිත් ඩබ්.ඩී. අමරදේවයන්ගේ සහභාගීත්වයෙන් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය 08 වන උපාධි ප්‍රදානෝත්සවය පැවැත්විණි. මෙහිදී ප්‍රථම උපාධි 711 ක් , පශ්චාද් උපාධි 15 ක් සහ එක් ආචාර්ය උපාධියක් ප්‍රදානය කෙරිණි. සැසි වාර දෙකකට පවත්වන ලද එම උපාධි ප්‍රධානෝත්සවයේ දී අප විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපති මහාචාර්ය සරත් අමුණුගම හා රුහුණු විශ්වවිද්‍යාලයේ උපකුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී සමරනායක යන මහතුන් විසින් උපාධි ප්‍රදානෝත්සවයේ දී විශේෂ දේශන පවත්වන ලදී.
පර්යේෂණ විධි ක්‍රම සම්බන්ධයෙන් වූ වැඩමුළුවක් විශ්වවිද්‍යාලයේ විධායක නිලධාරීන් උදෙසා 2015-11-21 වන දින පැවැත්විණි. කොළඹ විශ්වවිද්‍යාලයේ අංශ ප්‍රධාන, ආචාර්ය ඊ.එල්. සුනේත්‍රා, ජන විකාශන අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ජේ. පෙරේරා යන මහත්ම මහත්මීන් විසින් මෙම වැඩමුළුව පවත්වන ලදී.
2015-11-26 සහ 27 යන දෙදින තුළ **පර්යේෂණ පරිසංවාදය 2015** උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පණීභාරත රංග ශාලාවේ දී පැවැත්විණ. මෙහිදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය රත්නසිරි අරංගල මහතා විසින් විශේෂ දේශනය පවත්වන ලදී.

උපකුලපති

2015-11-26

* ප.උ.අ.ඒ. - පශ්චාද් උපාධි අධ්‍යයන ඒකකය
* කා.ම.ස.ඒ. - කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකය
* වි.දු.අ.කේ. - විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය
* වෘ.මා.ඒ. - වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය
* අ.ත.ස.ඒ. - අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකය
* ශා.අ.ඒ. - ශාරීරික අධ්‍යාපන ඒකකය

## 1.2 ආයතනික සංවිධාන සැලැස්ම



## 1.3 පාලක සභාව

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 44 වැනි වගන්ති ප්‍රකාරව සහ 1985 අංක 07 දරණ (සංශෝධිත) විශ්වවිද්‍යාල පනතේ 24 වැනි වගන්ති ප්‍රකාරව 2015 වසරේ විශ්වවිද්‍යාල පාලක සභාව පහත සඳහන් සාමාජිකයන්ගෙන් යුක්ත විය.

| | |
|---|---|
| උපකුලපති | මහාචාර්ය ආරියරත්න කළුආරච්චි මයා |

**පීඨාධිපතිවරුන්**

| | |
|---|---|
| පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | මහාචාර්ය සරත් චන්ද්‍රජීව මයා |
| දෘශ්‍ය කලා පීඨය | සහාය මහාචාර්ය එම්.ආර්.පොඩිනිලමේ මයා |
| සංගීත පීඨය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කුමාර ලියනවත්ත මයා |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මංගල සේනානායක මයා |

**සනාතන සභා නියෝජිත**

| | |
|---|---|
| නර්තන හා නාට්‍ය කලා පීඨය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මුදියන්සේ දිසානායක මයා |
| දෘශ්‍ය කලා පීඨය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඒ.සී.තේනුවර මයා |

**පහත සඳහන් සාමාජිකයින් 2014-09-01 දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන ලදී.**

කමල් පද්මසිරි මයා
හාෂ්වර සේනක ගුණරත්න මයා
ආචාර්ය රෝහණ වීරසිංහ මයා
මහාචාර්ය සුනිල් ආරියරත්න මයා
විශාරද එඩ්වඩ් ජයකොඩි මයා
ජයන්තා රුක්මනී සිරිවර්ධන මිය
ඒ.එම්.පී.අමරකෝන් මයා

**පහත සඳහන් සාමාජිකයින් 2015 අප්‍රේල් මස සිට අවුරුදු 3 ක කාලයක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නැවත පත් කරන ලදී.**

මහාචාර්ය කුසුමා කරුණාරත්න මිය
ආචාර්ය ධර්මසේන පතිරාජ මයා
ආචාර්ය එල්.ඒ.ඩබ්.සිරිසේන මයා
ආචාර්ය ජයලත් මනෝරත්න මයා
චිත්‍රා කරුණාරත්න මිය
සී.මාලියද්ද මයා
ගාමිණී සුමනසේකර මයා

**කාර්යාල උපස්ථිතියෙන්**

බී.එම්.දයාවංශ මයා - ලේඛකාධිකාරී

## 02. සම්මාන, ඇගැයීම්, සහ ප්‍රදානයන්

* නර්තන හා නාට්‍ය කලා පීඨයේ තෙවන වසර නාට්‍ය හා රංග කලාව හදාරන විද්‍යාර්ථීන්ගේ නිර්මාණයක් වන **මම අඩකුඹයි** නාට්‍ය සඳහා 2015 ජාතික යෞවන නාට්‍ය උළෙලේ දී හොඳම නිෂ්පාදනය, හොඳම අධ්‍යක්‍ෂණය, හොඳම තිර රචනය, (ජූරියේ සම්මාන). හොඳම නළුවා, හොඳම වේශ නිරූපණය, හොඳම ආලෝකකරණය, හොඳම පසුතල නිර්මාණය යන කුසලතා සම්මාන 06 ක් ජයග්‍රහණය කිරීමට සමත්විය.

* ඉන්දියාවේ පන්ජාබ් හි පැවැති 18 වන කාන්තා ජන නැටුම් තරඟාවලිය හා සැණකෙළිය නියෝජනය කරමින් සහභාගී වූ මෙම විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යවන්ගෙන් සමන්විත **තූර්යා වාද්‍ය** කණ්ඩායම, එහිදී
    - විශිෂ්ඨතම සංගීත නිර්මාණය
    - විශිෂ්ඨතම නර්තන කණ්ඩායම වශයෙන් ජයග්‍රහණ අත්පත් කර ගන්නා ලදී.

* 2015 වර්ෂයේ හොඳම නව නිර්මාණයට හිමි සම්මානය සංගීත පීඨයේ අසිත් අතපත්තු මහතා විසින් ද හොඳම ගායකයාට හිමි සම්මානය සංගීත පීඨයේ හර්ෂණ දිසානායක විද්‍යාර්ථියා විසින් ද රාජ්‍ය සංගීත සම්මාන උළෙලේ දී දිනා ගන්නා ලදී.

* රයිගම් ටෙලි සම්මාන උළෙලේ දී හොඳම ගායිකාවට හිමි සම්මානය සංගීත පීඨයේ කථිකාචාර්ය ඉන්දිකා උපමාලි මහත්මිය විසින් දිනා ගන්නා ලදී.

## 03. සම්පත් සහ සිසුන් පිළිබඳ විස්තර

### (අ.) සම්පත් සහ සිසුන් පිළිබඳ විස්තර 2015

| පීඨය | අධ්‍යයනාංශය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු අධ්‍යයනකාර්ය මණ්ඩලය | මුළු අධ්‍යයන සහායක කාර්යමණ්ඩලය | මුළු තාවකාලික කථිකාචාර්ය | මුළු බාහිර කථිකාචාර්ය මණ්ඩලය | මුළු අනධ්‍යයන |
|---|---|---|---|---|---|---|---|
| දෘශ්‍ය කලා පීඨය | චිත්‍ර කලා | 92 | 24 | 04 | 18 | 125 | 21 |
| | මූර්ති කලා | 51 | | | | | |
| | දෘශ්‍ය සන්නිවේදන නිර්මාණ කලා | 53 | | | | | |
| | සෙරමික් කලා | 32 | | | | | |
| | බහු ශික්‍ෂණාත්මක නිර්මාණ කලා | 38 | | | | | |
| | රෙදිපිළි හා ඇඟළුම් කලා | 48 | | | | | |
| | ඉතිහාසය හා කලා සිද්ධාන්ත | 33 | | | | | |
| | බහු මාධ්‍ය කලා | 47 | | | | | |
| | මුද්‍රණ කලා | 35 | | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **එකතුව** | | | **24** | **04** | **18** | **125** | **21** |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | | 1,2,3 සහ 4 වසර | | | | | |
| | උඩරට නර්තන | 481 | 41 | 34 | 06 | 24 | 15 |
| | පහතරට නර්තන | 164 | | | | | |
| | සබරගමු නර්තන | 62 | | | | | |
| | වාද්‍ය සංගීත | 20 | | | | | |
| | ඉන්දියානු සහ ආසියානු නර්තන | 59 | | | | | |
| | නර්තන රංගකලා ඉතිහාසය සහ සිද්ධාන්ත | 99 | | | | | |
| | නාට්‍ය කලා, මුද්‍රා නාට්‍ය සහ නූතන නැටුම් | 137 | | | | | |
| **එකතුව** | | **1022** | **41** | **34** | **06** | **24** | **15** |
| සංගීත පීඨය | | 1,2,3 සහ 4 වසර | | | | | |
| | උත්තර භාරතීය සංගීත | 384 | 38 | 16 | 02 | 45 | 17 |
| | දක්ෂිණ භාරතීය සංගීත | 21 | | | | | |
| | බටහිර සංගීත | 114 | | | | | |
| | මානව වංශ සංගීත | 100 | | | | | |
| | ව්‍යවහාරික සංගීත සහ ජනශ්‍රැති | 94 | | | | | |
| | සංගීත විද්‍යා | 30 | | | | | |
| **එකතුව** | | **743** | **38** | **16** | **02** | **45** | **17** |

(ආ). **සම්පත් සහ සිසුන් පිළිබඳ සංසන්දනාත්මක විස්තර 2014/2015**

| පීඨය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | | මුළු අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2014 | 2015 | 2014 | 2015 |
| දෘශ්‍ය කලා පීඨය | 445 | 427 | 26 | 24 | 04 | 04 |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | 1142 | 1015 | 41 | 41 | 34 | 34 |
| සංගීත පීඨය | 773 | 739 | 37 | 38 | 17 | 16 |
| **එකතුව** | **2360** | **2181** | **104** | **103** | **55** | **54** |

(ඈ.) ප්‍රථම උපාධිය 2015

| | | ඇතුලත් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|
| | | පළමු වසර | දෙවනවසර | තෙවනවසර | අවසාන වසර |
| දෘශ්‍ය කලා පීඨය | චිත්‍ර කලා පාඨමාලාව | 19 | 19 | 16 | 38 |
| | මූර්ති කලා | 08 | 14 | 10 | 19 |
| | දෘශ්‍යසන්නිවේදනනිර්මාණ කලා | 09 | 11 | 09 | 24 |
| | සෙරමික් කලා | 10 | 08 | 07 | 07 |
| | බහු ශිල්පනාත්මකනිර්මාණ කලා | 10 | 09 | 10 | 09 |
| | රෙදිපිළි හා ඇඟළුම් කලා | 13 | 12 | 09 | 14 |
| | ඉතිහාසය හා කලා සිද්ධාන්ත | 10 | 08 | 09 | 06 |
| | බහු මාධ්‍ය කලා | 09 | 08 | 10 | 20 |
| | මුද්‍රණ කලා | 09 | 09 | 08 | 09 |
| **එකතුව** | | **97** | **98** | **88** | **146** |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | උඩරටනර්තන | 96 | 110 | 123 | 152 |
| | පහතරටනර්තන | 39 | 39 | 37 | 49 |
| | සබරගමු නර්තන | 23 | 17 | 10 | 12 |
| | වාද්‍යසංගීත | 08 | 08 | 00 | 04 |
| | ඉන්දියානු සහ ආසියානු නර්තන | 22 | 17 | 12 | 08 |
| | නාට්‍ය කලා,මුද්‍රා නාට්‍ය සහ නූතන නැටුම් | 35 | 32 | 53 | 17 |
| | නර්තන රංගකලා ඉතිහාසය සහ සිද්ධාන්ත | 29 | 27 | 21 | 22 |
| එකතුව | | 252 | 250 | 256 | 264 |
| සංගීත පීඨය | උත්තර භාරතීය සංගීත | 113 | 98 | 94 | 79 |
| | දක්ෂිණ භාරතීය සංගීත | 09 | 09 | 01 | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | බටහිර සංගීත | 28 | 36 | 20 | 30 |
| | මානව වංශ සංගීත | 30 | 25 | 28 | 17 |
| | ව්‍යවහාරික සංගීත සහ ජනසන්නිවේදන | 34 | 21 | 14 | 19 |
| | සංගීත විද්‍යා | 09 | 06 | 09 | 06 |
| එකතුව | | 223 | 195 | 166 | 153 |

**ප්‍රථම**

**උපාධිය පිළිබඳ සංසන්දනාත්මක විස්තර 2014/2015**

| පීඨය | ඇතුළත් කරනලද ශිෂ්‍ය සංඛ්‍යාව | | උපාධි ලබා පිටවූ සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | 2014 | 2015 | 2014(2008/09) | 2015 (2009/10) |
| දෘශ්‍ය කලා පීඨය | 98 | 97 | 61 | 110 |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | 254 | 248 | 182 | 359 |
| සංගීතපීඨය | 198 | 226 | 133 | 226 |
| එකතුව | 550 | 571 | 376 | 695 |

(ඈ.) **උපාධිලාභීන්ගේ විස්තර (2015)**

| **පීඨය** | විභාගයසඳහා පෙනීසිටි සංඛ්‍යාව | පළමු පෙළ | දෙවන පෙළ (ඉහළ) | දෙවන පෙළ(පහළ) | සමත් | උපාධිය සම්පූර්ණ කළ සංඛ්‍යාව | අසම්පූර්ණ |
|---|---|---|---|---|---|---|---|
| දෘශ්‍ය කලා පීඨය | 112 | 04 | 58 | 35 | 13 | 110 | 02 |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | 369 | 59 | 208 | 73 | 19 | 359 | 10 |
| සංගීතපීඨය | 257 | 29 | 91 | 49 | 57 | 226 | 31 |
| එකතුව | 738 | 92 | 357 | 157 | 89 | 695 | 43 |

## 4. කාර්ය මණ්ඩල විස්තර

### 4.1. අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර

| පීඨය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | කථිකාචාර්ය/සහකාර කථිකාචාර්ය (තාවකාලික) | කථිකාචාර්ය (ආධුනික) | උපදේශක | සහාය වාදක | ප්‍රදර්ශක | බාහිර කථිකාචාර්ය | විද්‍යාත්මක සහකාර (II ශ්‍රේණිය) | සහකාර පරිගණක ජාල කළමනාකරු II | ශාරීරික අධ්‍යාපන උපදේශක(I ශ්‍රේණිය) | ක්‍රමසම්පාදක සහ පද්ධති විශ්ලේෂක (I ශ්‍රේණිය) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දෘශ්‍ය කලා පීඨය | - | 01 | 02 | 09 | 01 | 18 | 11 | 04 | - | - | 125 | - | - | - | - |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | 02 | 03 | 01 | 23 | 04 | 03 | 08 | 21 | 02 | 11 | 24 | - | - | - | - |
| සංගීත පීඨය | - | 01 | 01 | 20 | 04 | 02 | 12 | 06 | 09 | - | 45 | 01 | - | - | - |
| පරිගණක මධ්‍යස්ථානය | - | - | - | 02 | 01 | - | - | 01 | - | - | - | - | 02 | - | - |
| ඉංග්‍රීසි ඒකකය | - | - | - | - | - | - | 02 | - | - | - | - | - | - | - | - |
| බහු ශික්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය | - | - | - | - | - | - | 01 | 02 | - | - | - | - | - | - | - |
| ශාරීරික අධ්‍යාපන ඒකකය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 01 | - |
| විභාග අංශය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 01 |

| | පුස්තකාලයාධිකාරී | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී | සහකාර පුස්තකාලයාධිකාරී |
|---|---|---|---|
| පුස්තකාලය | 01 | 01 | 02 |

### 4.2. පරිපාලන කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

| පීඨය/ශාඛාව | පරිපාලන | අනධ්‍යයන | කණිෂ්ඨ |
|---|---|---|---|
| දෘශ්‍ය කලා පීඨය | 01 | 11 | 10 |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | 01 | 11 | 04 |
| සංගීත පීඨය | 01 | 14 | 03 |
| උපකුලපති කාර්යාලය | 01 | 02 | 02 |
| ලේඛකාධිකාරී කාර්යාලය | 01 | 02 | 02 |
| අධ්‍යයන ආයතන | 01 | 03 | 01 |
| අනධ්‍යයන ආයතන | 01 | 03 | 01 |
| විභාග අංශය | 01 | 06 | 01 |
| අධ්‍යයන සහ ශිෂ්‍ය සේවා | 01 | 07 | 01 |

| | | | |
|---|---|---|---|
| සාමාන්‍ය පාලන | 01 | 13 | 19 |
| මුදල් | 04 | 14 | 03 |
| පර්යේෂණ හා ප්‍රකාශන | 01 | 01 | 01 |
| අභ්‍යන්තර විගණන | 02 | 01 | 01 |
| නීති හා ප්‍රලේඛන | - | - | - |
| ශාරීරික අධ්‍යාපන ඒකකය | | 01 | 01 |
| විවෘත හා දුරස්ථඅධ්‍යයන | 02 | 05 | 01 |
| පශ්චාද් උපාධි අධ්‍යයන | 01 | 01 | 01 |
| පර්යේෂණ හා මාධ්‍ය | - | 02 | - |
| කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකය | - | - | - |
| වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | - | - | - |
| සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානය | - | 02 | 04 |
| නඩත්තු අංශය | 01 | 03 | 18 |
| සංයුක්ත කළමනාකරණ අංශය | 01 | 01 | - |
| පුස්තකාලය | - | 06 | 05 |

### 4.3 සමස්ත කාර්ය මණ්ඩල වෙනස්වීම්

| | අධ්‍යයන | අධ්‍යයන සහායක | පරිපාලන සහ මුල්‍ය | අනධ්‍යයන |
|---|---|---|---|---|
| නව පත්වීම් | - | 01 | 03 | 11 |
| සේවයේ තහවුරු කිරීම් | 09 | 34 | 03 | 12 |
| උසස්වීම් | 04 | 03 | - | 06 |
| ස්ථාන මාරුවීම් (වෙනත් වි.විද්‍යාලසිට මෙම වි.විද්‍යාලයට) | - | - | 01 | 05 |
| සේවා දීර්ඝ කිරීම් (අවු.57 න් ඔබ්බට) | - | 01 | 02 | 01 |
| විශ්‍රාම යෑම් | 02 | - | - | 01 |
| ඉල්ලා අස්වීම් | 01 | - | 01 | 01 |
| තනතුර අතහැර යෑම් | - | - | - | 02 |
| සේවය අත්හිටුවීම් | - | - | - | - |
| සප්ත වාර්ෂික නිවාඩු | 06 | - | - | - |
| අධ්‍යයනනිවාඩු | 07 | - | 02 | - |
| එතෙර නිවාඩු | 39 | 20 | 05 | 02 |
| අධ්‍යයන නිවාඩු දීර්ඝ කිරීම් | 12 | - | - | - |
| සප්ත වාර්ෂික නිවාඩු අවසන් වී සේවයට වාර්තා කිරීම් | 02 | - | - | - |
| අධ්‍යයන නිවාඩු අවසන් වී සේවයට වාර්තා කිරීම් | 08 | - | - | - |
| මරණ | - | 01 | - | - |

## 5. පශ්චාද් උපාධි පිළිබඳ විස්තර

පශ්චාද් උපාධි අධ්‍යයන පාඨමාලා - මාධ්‍ය (සිංහල)

| පාඨමාලාවේ නම | 2015 වර්ෂයේ ඇතුළත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව | 2015 අවසන් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව | 2015 වර්ෂයේ දී පශ්චාද් උපාධි නිබන්ධන භාරදී අගැයීමට යොමුකොට ඇති සංඛ්‍යාව |
|---|---|---|---|
| දර්ශනපති (M.Phil) උපාධි පාඨමාලාව | 14 | 01 | 06 |
| දර්ශනසූරි (Ph.D) | 01 | 01 | - |
| ශාස්ත්‍රපති (MA) | - | 03 | 05 |
| ප්‍රාසංගික කලාපති (MPA) | - | 10 | 04 |

## 6. බාහිර උපාධි පාඨමාලා පිළිබඳ විස්තර

| ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | ප්‍රාසංගික කලාවේදී නර්තන උපාධි බාහිර(සාමාන්‍ය) පාඨමාලාව 2013/2014 | | ප්‍රාසංගික කලාවේදී නර්තන උපාධි (සාමාන්‍ය) පාඨමාලාව 2014/2015 |
|---|---|---|---|
| | පළමු වසර | දෙවන වසර | පළමු වසර |
| | 253 | - | - |

## 7. පර්යේෂණ පිළිබඳ විස්තරය

පර්යේෂණ පරිසංවාදය සහ පර්යේෂණ දීමනා

| පීඨය | පර්යේෂණ දීමනාව ලබාගත් ආචාර්යවරු සංඛ්‍යාව | පර්යේෂණ දීමනාව ලබා නොගත් ආචාර්යවරු සංඛ්‍යාව | පර්යේෂණ පරිසංවාදය සඳහා ඉදිරිපත් කිරීමට අනුමත කරන ලද සංක්ෂිප්ත සංඛ්‍යාව |
|---|---|---|---|
| දෘශ්‍ය කලා පීඨය | 15 | 08 | 07 |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | 40 | 01 | 04 |
| සංගීතපීඨය | 33 | 05 | 04 |
| පුස්තකාලය | 04 | - | - |
| බහු ශික්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය | 02 | - | - |
| පරිගණක ඒකකය | 02 | - | 01 |
| ඉංග්‍රීසි ඒකකය | 02 | - | 02 |
| පරිපාලන කාර්යමණ්ඩලය | 12 | - | 0 |

මීට අමතරව සෞන්දර්ය කල විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ උපාධි අපේක්ෂිකාවන් දෙදෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණ සංක්ෂිප්ත 02 ක් සහ පහත සඳහන් විශ්වවිද්‍යාලයන්හි ආචාර්යවරු විසින් ඉදිරිපත් කරනු ලැබූ පර්යේෂණ සංක්ෂිප්ත 2015 පර්යේෂණ පරිසංවාදය සඳහා ඉදිරිපත් කරනලදී. 2015.11.26 සහ 27 යන දිනයන්හි පර්යේෂණ පරිසංවාදය පවත්වන ලදී.

| පීඨය/විශ්වවිද්‍යාලය | පර්යේෂණ පරිසංවාදය සඳහා අනුමත කරන ලද සංක්ෂිප්ත සංඛ්‍යාව |
|---|---|
| මොරටුව විශ්වවිද්‍යාලය | 02 |
| ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 01 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 01 |
| ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 01 |

2015 වර්ෂයට අදාළව නිම කරන ලද පර්යේෂණ සංඛ්‍යාව

| පීඨය/ ඒකකය | නර්තන හා නාට්‍ය කලා පීඨය | සංගීත පීඨය | දෘශ්‍ය කලා පීඨය | තොරතුරු තාක්ෂණ ඒකකය | ඉංග්‍රීසි භාෂා ඉගැන්නුම් ඒකකය | පුස්තකාලය |
|---|---|---|---|---|---|---|
| නිම කරන ලද පර්යේෂණ සංඛ්‍යාව | 04 | 09 | 03 | 03 | 1 | 02 |

## 8. කාර්ය මණ්ඩල සංවර්ධනය පිළිබඳ විස්තර

### 8.1 පරිපාලන කාර්යය මණ්ඩල සහභාගි වූ සම්මන්ත්‍රණ වැඩසටහන් සහ වැඩමුළු විස්තර

| අනු අංකය | වැඩමුළුව/සම්මන්ත්‍රණය | මෙහෙයවනු ලබන ආයතනය | සහභාගී වූ නිලධාරීන් | පැවැත්වූ කාලසීමාව |
|---|---|---|---|---|
| 01 | **Training Programme on Cooperate strategy among innovation** | **Naresuan University** | 1.ඒ.එල්.ඩබ්.අමරතුංග මිය<br>2.ජේ.එස්.ආර්.එස්.ගුණසේකර මයා | 2015.01.26<br>2015.02.03 |
| 02. | **Public Property** | **Prag Institute** | 1.එල්.ඒ.එස්.ජයසේකර මයා<br>2.පී.එම්.කේ.සුභවීර මයා<br>3.පී.ඒ.ටී.ඩී.පෙරේරා මිය<br>4.ආර්.ඒ.ගුණපාල මයා | 2015.02.12 |

| | | | | |
|---|---|---|---|---|
| 03. | **Internal Control & Audit** | **APFA** | 1.ජේ.පී.බාලසූරිය මිය<br>2.එච්.ඒ.ආර්.සී.බෝපාගොඩ මෙය | 2015.08.07 සහ 08 |
| 04. | බස්නාහිර පළාත් විශ්වවිද්‍යාලපීඨාධිපතිවරුන් සහ ලේඛකාධිකාරී, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියපිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | රාජ්‍ය භාෂා කොමිෂන් සභාව | 1.මහාචාර්ය ඒ. කළුආරච්චි මහතා<br>2.මහාචාර්ය ආර්.එම්.එස්.චන්ද්‍රජීව මහතා<br>3.එස්.එම්.එම්.සේනානායක මහතා<br>4.එස්.කේ.ලියනවත්ත මහතා<br>5.බී.එම්.දයාවංශ මහතා | 2015.10.08 |
| 05. | **Public Procument Management** | **APFASL** | 1. ආර්.ටී.එම්. රණතුංග මිය<br>2. ඒ.එල්.ඩබ්. අමරතුංග මිය<br>3. සී.වී. ඉඹුල්ගොඩ මිය<br>4. පී.එන්.ස්වර්ණලතා මිය<br>5. එස්.වී.එන්.පෙරේරා මිය<br>6. එල්.ඒ.එස්.ජයසේකර මයා<br>7. ආර්.ටී.එස්.රණසිංහ මිය<br>8. ඩී.එච්.ඒකනායක මිය<br>9. පී.ඒ.ටී.ඩී. පෙරේරා මිය<br>10. ඩී.කේ.කේ. නාරම්පනාව මෙය<br>11. පී.එම්.කේ.සුබවීර මයා<br>12. ජේ.එස්.ආර්.එස්.ගුණසේකර මයා<br>13. ජේ.පී. බාලසූරිය මිය | 2015.09.28<br>2015.09.29 |
| 06. | **Public Sector Accounting Standards** | **Institute of Lanka Charted Accounted Sri Lanka** | ඩබ්ලිව්.එම්.ඩබ්ලිව්.වන්නිනායක මහතා | 2015.10.05 |

8.2 අනධ්‍යයන කාර්යය මණ්ඩල සහභාගි වූ සම්මන්ත්‍රණ වැඩසටහන් සහ වැඩමුළු විස්තර

| අනු අංකය | වැඩමුළුව/සම්මන්ත්‍රණය | මෙහෙයවනු ලබන ආයතනය | සහභාගී වූ නිලධාරීන් | පැවැත්වූ කාලසීමාව |
|---|---|---|---|---|
| 01 | **Communication for institutional Development** | **Kasetsart**විශ්ව විද්‍යාලය, තායිලන්තය | 1. එල්.පී.ආර්.ඩබ්ලිව්.ජයසිංහ මිය<br>2. පී.එන්.චතුරංග මහතා | 2015.01.11 දින සිට 2015.01.24 දින දක්වා |
| 02. | **Conducting workshop ok Skill Development for Drivers and Minor Employees** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 1.ආර්.එම්.එස්.කේ. රණසිංහ මයා<br>2.කේ.ඒ.ඩී. ජයවර්ධන මයා<br>3.ඩබ්.පී.විතාරමගේ මයා<br>4.යූ.එච්.ජේ.පී.කේ.ප්‍රියදර්ශන මයා<br>5.ඩබ්.එල්.මෛත්‍රීපාල මයා | 2015.07.1 දින |

## 09.යටිතල පහසුකම් පිළිබඳ විස්තර

2015 වසර තුළ යටිතල පහසුකම් පිළිබඳ විස්තර

| යටිතල පහසුකම් පිළිබඳ විස්තර | මුළු පිරිවැය ඇස්තමේන්තුව (TCE) (රුපියල් මිලියන) | 2015 වර්ෂය වන විට වියදම (රුපියල් මිලියන) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| ඇල්බට් චන්ද්‍රවංක සංවර්ධන ව්‍යපෘතිය (අදියරIII – පියවරII) සංගීත පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම. | 68.0 | 19.9 | 75% |
| ඇල්බට් චන්ද්‍රවංක සංවර්ධන ව්‍යපෘතිය (අදියරIV) සංගීත පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම. | 144.5 | 104.5 | 100% |
| ඇල්බට් චන්ද්‍රවංක සංවර්ධන ව්‍යපෘතිය (අදියරIV- පියවරII) සංගීත පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම. | 68.2 | 14.4 | 5% |
| Stage Lighting and Communication Wiring (සංගීත පීඨ ශ්‍රවණාගාරය සඳහා) | 10.3 | 6.8 | 100% |
| Acoustic Wall Paneling Wiring (සංගීත පීඨ ශ්‍රවණාගාරය සඳහා) | 24.2 | 5.2 | 45% |

## 10. පුස්තකාලය පිළිබඳ තොරතුරු

පුස්තකාල ග්‍රන්ථ එකතුවේ සංසන්දනාත්මක විස්තර 2014/2015

| | 2014 | 2015 |
|---|---|---|
| මුළුපොත් ගණන | 52362 | 53514 |
| සඟරා ගණන | 48 | 45 |

## 11. මහපොළ හා ශිෂ්‍යාධාර ලබන්නන්ගේ විස්තර (2015)

| පීඨය | මහපොළ ශිෂ්‍යත්ව ලබීන් සංඛ්‍යාව | ගෙවීම් විස්තරය රු. | ශිෂ්‍යාධාර ලබීන් සංඛ්‍යාව | ගෙවීම් විස්තරය රු. |
|---|---|---|---|---|
| දෘශ්‍ය කලා පීඨය | 171 | 4,973,700.00 | 224 | 3,390,200.00 |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | 262 | 12,545,800.00 | 680 | 9,169,600.00 |
| සංගීත පීඨය | 257 | 8,013,800.00 | 371 | 6,665,500.00 |
| **එකතුව** | **690** | **25,533,300.00** | **1275** | **19,225,300.00** |

## 12. විගණන කමිටු වාර්තාව

**හැඳින්වීම**

විගණන කමිටුව විශ්වවිද්‍යාල පාලක සභාවේ අනු කමිටුවකි. අභ්‍යන්තර විගණන අංශය මගින් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන, පරිපාලන හා මූල්‍ය කටයුතු පිළිබඳ පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමයට සහභාගී වී, එම කටයුතුවල වංචා හා වැරදි වැළැක්වීම සහ ඒවා අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත්භාවය හා ප්‍රමාණාත්මක භාවය පිළිබඳව අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගැයීමක් සිදුකර ඵලදායි යහපාලනයක් පවත්වමින්, රාජ්‍ය සම්පත්වල මනා කළමණාකරණයක් ඇතිකිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම විගණන කමිටුව මගින් සිදුකරනු ලැබේ.

**ජයග්‍රහණ**

සමාලෝචිත වර්ෂයේදී අවස්ථා හතරකදී රැස්වූ විගණන කමිටුව, 2013 හා 2014 වර්ෂ සඳහා වූ විස්තරාත්මක විගණකාධිපති වාර්තා 2 හි හා අභ්‍යන්තර විගණන අංශය විසින් වරින්වර උපකුලපතිතුමා වෙත ඉදිරිපත් කරතිබූ අභ්‍යන්තර විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණ හා ඒ සඳහා වූ විසඳුම් සමාලෝචනය කරමින්, එවැනි නිරීක්ෂණ නැවත ඇති නොවන ආකාරයට කටයුතුකිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබාදීමටත්, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අඛණ්ඩව නිරීක්ෂණය කිරීමටත් කටයුතු කරනලදී.

අභ්‍යන්තර විගණන අංශය සමාලෝචිත වර්ෂයේදී, එම අංශය වෙත යොමුකරන ලද සියලුම පූර්ව විගණනයන් නිමකරන ලද අතර, වර්ෂය තුල ලද සියලුම රජයේ විගණන විමසුම්, කෙටුම්පත් විගණකාධිපති වාර්තාව හා විස්තරාත්මක විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු සැපයීම සම්බන්ධීකරණය කොට සංගෘහිත කිරීම සිදුකරන ලදී. ක්ෂණික අවධානය යොමුවිය යුතු ක්ෂෙත්‍ර/කරුණු රැසක් සම්බන්ධයෙන්, පරීක්ෂා කර වාර්තා කරන ලෙස උපකුලපතිතුමා විසින් කරන ලද විධානයන් අනුව, නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීමටද අභ්‍යන්තර විගණන අංශයට හැකිවිය.

**බාධක**

පූර්ව විගණන කටයුතු හා විශේෂ විමර්ශනයන් සඳහා සැලකිය යුතු කාලයක් වෙන් කිරීමට සිදුවීම නිසාත්, විගණන කටයුතු කරගෙන යාම සඳහා විගණන සහකාරවරුන් නොමැතිවීම නිසාත්, සමාලෝචිත වර්ෂයට අදාල අභ්‍යන්තර විගණන සැලසුමෙහි සඳහන් විගණන කටයුතු සම්පූර්ණයෙන්ම නිමකිරීමට නොහැකි විය.

**අනාගත සැලසුම්**

අභ්‍යන්තර විගණන අංශයට අවශ්‍ය කාර්ය මණ්ඩලය ලබා ගැනීමටත්, වාර්ෂික විගණන සැලැස්ම නිසි අයුරින් ක්‍රියාත්මක කර, විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කර, එය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත.